සැ. යු.- 2012.02.10 දින පළ වූ අංක 1,745 දරන ගැසට් පත්‍රයේ I-III, III සහ IV(අ) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,746 - 2012 පෙබරවාරි මස 17 වැනි සිකුරාදා - 2012.02.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## III කොටස - ඉඩම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් : | |
| ප්‍රාරම්භක දැන්වීම් .... ... ... ... | — |
| අවසාන නියෝග .... ... ... ... | — |
| ආණ්ඩුවේ ඒජන්තවරු විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |

| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරී විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් .... ... ... | — |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් .... ... | 36 |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් .... ... | — |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම .... ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් .... ... | 37 |


**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳ ව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳ ව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලි ව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳ ව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම් 2012 පෙබරවාරි මස 24 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2012 පෙබරවාරි මස 10 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂ්මන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2012 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

35 - B 80301—2,300 (2012/02)
E -1

# ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම්

ඇමුණුම 9

### ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19 වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

සබරගමුව පළාත් සභාවේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, ඇලපාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම්/ නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) රංජනී හේමලතා සමරසිංහ දිසානායක වන මම, ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19 වගන්තියේ (4) වන උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1996.06.20 දින ප්‍රදානය කර ඇති අංක රත්/ප්‍ර/34100 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන අළුකැටිය පදිංචි කොළොම්බුගම ආචාරිගේ ඥාණසේන වෙත ප්‍රදානය කොට රත්නපුර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක ජයභූමි ඉ. සං. 14/1382 යටතේ 1996.10.09 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද, ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් 2012.03.19 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

#### උපලේඛනය

රත්නපුර පරිපාලන දිස්ත්‍රික්කයේ ඇලපාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නවදුන් කෝරලේ පල්ලේ පත්තුවේ කොටාමුල්ල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ අළුකැටිය නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, රත්නපුර මැනුම් අධිකාරී භාරයේ ඇති සහ සර්වේ ජනරාල් වරයා විසින් සම්පාදිත අංක අ.ග.පි. 81 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි..............විසින් සම්පාදිත අංක............ දරන කට්ටි කැඩීමේ පිඹුරේ................ විසින් සම්පාදිත අංක .................. දරන රේඛා සටහනේ අංක ලොට් 145 කොටසක් දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර්/අක්. 0, රූඩ් 02, පර්. 16 ක් විශාලත්වය ඇත්තාවූ ද, ඇලපාත ප්‍රාදේශීය ලේකම්ගේ ඇප්‍රාලේ/50/2/774 හා 1999.03.24 දිනැති අවසරය මත බලයලත් මිනින්දෝරු කේ. ඊ. සුමතිරත්න මහතා විසින් සකස් කරන ලද අංක 110 දරන පිඹුරට අනුව කැබලි අංක 02 යනුවෙන් පෙන්වා දී ඇති අක්. 0, රූ. 0, පර්. 35.6 ක් විශාල පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම :

| | | |
|---|---|---|
| *උතුරට* | : | ලොට් 75 සහ මෙම ඉඩමේ කොටසක් වන කැ. අ. 01; |
| *නැගෙනහිරට* | : | මෙම ඉඩමේ කොටසක් වන කැ. අ. 01 සහ ලොට් 85; |
| *දකුණට* | : | ලොට් 85 සහ මෙම ඉඩමේ කොටසක් වන කැ. අ. 03; |
| *බස්නාහිරට* | : | මෙම ඉඩමේ කොටසක් වන කැ. අ. 03 සහ ලොට් 146,75. |

ආර්. එච්. එස්. දිසානායක,
ප්‍රාදේශීය ලේකම්,
ඇලපාත.

2010 මැයි මස 07 වැනි දින.

02-368

ඇමුණුම 9

### ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19 වන වගන්තියේ (4) වන උප වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහාවූ නිවේදනයයි

සබරගමුව පළාත් සභාවේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, රත්නපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම්/චිත්‍රා මානෙල් කෝට්ටවත්ත වන මම, ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19(4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1996.07.22 දින ප්‍රදානය කර ඇති අංක රත්/ප්‍ර/33737 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන රත්නපුර, කනේගල්ල පදිංචි මැදගෙදර ජුවානියලාගේ සිරිසේන වෙත ප්‍රදානය කොට රත්නපුර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක ජයභූමි ඉ. සං. 01/3341 යටතේ 1996.10.04 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2012.03.19 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

#### උපලේඛනය

රත්නපුර පරිපාලන දිස්ත්‍රික්කයේ රත්නපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කුරුවිටි කෝරළේ දකුණු උඩ පත්තුවේ උතුරු ගිලිමලේ ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ කොරවතුහේන මූකලාන නැමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, රත්නපුර මැණුම් අධිකාරී භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක අ. ග. පි. 335 දරන .................විසින් සම්පාදිත අංක ..................... දරන කට්ටි කැඩීමේ පිඹුරේ................. විසින් සම්පාදිත අංක ..................... දරන රේඛා සටහනේ අංක 03 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර්/අක්කර 01, රූඩ් -, පර්චස් - ක් විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම්වූ ද රජයේ ඉඩම : කොරවතුහේන මූකලාන

| | | |
|---|---|---|
| *උතුරට* | : | කැබලි අංක 04, කොස්ගස් මණ්ඩියදොල රක්‍ෂිතය; |
| *නැගෙනහිරට* | : | කැබලි අංක 02, කොස්ගස් මණ්ඩිය, දොල රක්‍ෂිතය; |
| *දකුණට* | : | කැබලි අංක 02, ලොට් 129 කොටසක් ; |
| *බස්නාහිරට* | : | කැබලි අංක 05, ලොට් 129 කොටසක්. |

සී. එම්. කෝට්ටවත්ත,
ප්‍රාදේශීය ලේකම්,
රත්නපුර.

2010 දෙසැම්බර් මස 21 වැනි දින.

02-367

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/23030.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය : සීපීසී/එල්සී/8/1/27/97

### 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය

මාතලේ දිස්ත්‍රික්කයේ දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් කණ්ඩලම ඊ 449 ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ කණ්ඩලම ගමේ අංක අ.ග.පි. 420 පිඹුරේ/අනුරේඛනයේ කැබලි අංක 1 හා 2 වශයෙන් දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 5.230 ක් පමණ වූ රජයේ ඉඩම් කැබලි කෘෂිකාර්මික කටයුත්තක් සඳහා දොන් වයි ජේ හොටෙල්ස් (පුද්) සමාගම විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ:

| | | |
|---|---|---|
| *උතුරට* | : | දඹුල්ල කුඹුක්කඳන්වල පාර රක්ෂිතය |
| *නැගෙනහිරට* | : | දඹුල්ල කුඹුක්කඳන්වල පාර රක්ෂිතය අ.ග.පි. 420 කැ. අ. 133 ; |
| *දකුණට* | : | අ.ග.පි. 420 කැ. අ. 133 අනුරේඛනයේ කැ. අ. 2 සහ අ.ග.පි. 420 කැ. අ. 132; |
| *බටහිරට* | : | අ.ග.පි. 420 කැ. අ. 132 කැ. අ. 44, දඹුල්ල කුඹුක්කඳන්වල පාර රක්ෂිතය. |

ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :

*බදු කාලය*.- අවුරුදු තිහයි (30) (2011.08.23 සිට ඉදිරියට ) ;

*වාර්ෂික බදු මුදල*.- ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත ඉඩමේ 2011 වර්ෂයේ වාණිජමය වටිනාකමින් 4% කි. මෙම බදු මුදල කලින් තිබූ ප්‍රමාණයෙන් 50% ප්‍රමාණයකට අඩු නොවන සේ අවුරුදු පහකට වරක් සංශෝධනය විය යුතුය.

*වාර මුදල* :- වාර්ෂික බදු මුදල මෙන් තුන් ගුණයකි.

03. බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01ක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතුය ;

04. බදු ගන්නන් විසින් මෙකී ඉඩම කෘෂිකාර්මික කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය ;

05. ප්‍රාදේශීය ලේකම්, ස්කෝපින් කමිටුව සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසි වලට ද මෙම බද්ද යටත් විය යුතුය.;

06. ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාලසීමාව තුල අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ. ;

07. අවුරුදු 05 ක අවම කාලයක් ඉක්මවීමට කලින් අතුරු බදුදීම් කළ නොහැක.;

08. බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත;

09. සාදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතුය ;

මෙහි පහත සඳහන් දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

පී. ඩී. අයි. එල්. විජේගුණවර්ධන,
ඉඩම් කොමසාරිස්,
*ඉඩම් කොමසාරිස් ජනරාල් වෙනුවට.*

2012 ................
කොළඹ 07,
හෙක්ටර් කොබ්බෑකඩුව මාවතේ අංක 07 හි
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

02-471

---

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/25972.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය : සීපීසී/එල්සී/එල්ඩී/4/1/29/129.

### අංක 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය

මාතලේ දිස්ත්‍රික්කයේ නාඋල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හබරගහමඩ ග්‍රාම නිලධාරි වසමේ අරංගලයාය ගමේ පිහිටි අංක අ. ග. පි. 251 අති 15 පිඹුරේ කට්ටි අංක 530න් කොටසක් ප්‍රමාණයෙන් හෙක්ටයාර 0.0506ක් පමණ වූ රජයේ ඉඩම් කැබැල්ලක් නේවාසික කටයුතු සඳහා ජයලත්ගේ ලාලනී රම්‍යලතා උඩවල්පොල විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ:-

| | | |
|---|---|---|
| *උතුරට* | : | කැබලි අංක 514 ; |
| *නැගෙනහිරට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස ; |
| *දකුණට* | : | කැබලි අංක 529 පාර ; |
| *බටහිරට* | : | කැබලි අංක 508 1/2. |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට සහ පහත සඳහන් කොන්දේසි වලට යටත් කොට ඉඩම් බදු දීමට රජය අදහස් කොට තිබේ :-

*(අ)* *බදු කාලය* : අවුරුදු තිහයි. (30) (1995.06.15 දින සිට );

*(ආ)* *වාර්ෂික බදු මුදල* .- ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත 1995 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 4%කි;

*දඩ මුදල* .- ඉඩමේ දියුණු වටිනාකමින් 4% බැගින් වූ මුදල මෙන් තුන් ගුණයකි;

*(ඇ)* ඉඩම නේවාසික කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය;

(ඈ) බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01ක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය;

(ඉ) ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය;

(ඊ) සාදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය;

(උ) ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබා ගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ;

(ඌ) 2011.12.28 දින සිට අවුරුදු පහක (5) අවම කාලයක් ඉකුත්වීමට පෙර අතුරු බදුදීම් කළ නොහැක.

(එ) බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන් හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත;

මෙහි පහත සඳහන් දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

කුෂානි බොරලැස්ස,
සහකාර ඉඩම් කොමසාරිස්,
*ඉඩම් කොමසාරිස් ජනරාල් වෙනුවට.*

2012 ජනවාරි මස 27 වැනි දින,
බත්තරමුල්ල රජමල්වත්ත පාරේ අංක 1200/6 හි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

02-632

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.